ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය (SLWJA)
මාධ්‍යසේවක වෘත්තීය සමිති සම්මේලනය (FMETU)
ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංසදය (SLMMF)
ශ්‍රී ලංකා දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සන්ධානය (SLTJA)
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM)

මාධ්‍ය නිවේදනය/ 2008 ජුනි 23

## මාධ්‍ය (ස්වයං) වාරණයක් සඳහා ආරක්‍ෂක අමාත්‍යංශය මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරයි

ආරක්‍ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි මෑත දී පළ කරන ලද කතුවැකියකින් සන්නද්ධ හමුදාවන්ට අදාළ තොරතුරු වාර්තාකරණයේදී මාධ්‍ය විසින් පිළිපැදිය යුතු යැයි යෝජිත මාර්ගෝපදේශ මාලාවක් සහ ඒ පිළිබඳව වූ අමාත්‍යාංශයේ අදහස් ද ප්‍රකාශයට පත් කර තිබේ. මෙම කතුවැකියෙහි සඳහන් කරුණු ආණ්ඩුවේ මේ පිළිබඳව වූ නිල ප්‍රතිපත්තිය නිරූපනය කරන්නේ දැයි පැහැදිලි නැති නමුත් එහි අඩංගු කරුණු සැලකිල්ලට ලක් කළ විට පෙනී යන්නේ මාධ්‍ය තුළ ස්වයං වාරණයක් ඇති කිරීමේ අභිලාශයෙන් යුතුව මෙම මාර්ගෝපදේශ ප්‍රකාශයට පත්කර ඇති බව යි.

මාධ්‍ය නිදහස පිළිබඳ පොදුවේ ආණ්ඩුවේත් විශේෂයෙන් ආරක්‍ෂක අමාත්‍යාංශයේත් ඇති ආකල්පය එම කතුවැකිය තුළ වෙසෙසින් කැපී පෙනෙයි. එම කතුවැකිය විසින් ගොඩනගා ඇති තර්කය වන්නේ මහජනයා දැන ගත යුතු වැදගත් හමුදාමය කරුණු පිළිබඳව මාධ්‍ය විසින් දක්වන පරීක්‍ෂාකාරීත්වයත්, එම කරුණු සාකච්ඡාවට ගෙන ඒමත් ජාතික ආරක්‍ෂාවට එරෙහි වූත්, ත්‍රස්තවාදයට උපකාර කරන්නාවූත් ක්‍රියාවන් බව ය. එහෙයින් එවැනි ක්‍රියාවන් මෙහි හඳුන්වන්නේ රාජද්‍රෝහී ක්‍රියාවන් ලෙස ය. මෙය ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වලට මෙන්ම ආණ්ඩුවේ ප්‍රධානම කාර්යයක් වූ ත්‍රස්තවාදයට එරෙහිව තම යුද්ධය පිළිබඳ පොදු උනන්දුවට අගෞරව කිරීමක් සහ එය නොසලකා හැරීමකි.

"සමහර ඊනියා ආරක්‍ෂක විශ්ලේෂකයන් තම ආරක්‍ෂක තොරතුරු වාර්තාකරණයේදී අනුගමනය කරනු ලබන ආචාරධර්ම විරෝධී පියවරයන් පිළිබඳව අමාත්‍යාංශයේ උපරිම සහ තියුණු අවධානය යොමු වී තිබේ" ය යනුවෙන් කරන සඳහන් තුළ මෙම කරුණු පිළිබඳව ආරක්‍ෂක අමාත්‍යාංශයේ ස්ථාවරය කතුවැකිය විසින් නිශ්චිත ලෙසම හෙළිකරයි.

"එහෙයින් සොල්දාදුවන්; සොරුන් හෝ මෝඩයන් ලෙස පෙන්වමින් චෝදනා නඟන සහ ඔවුන්ට එරෙහිව පදනම් විරහිත විවේචන එල්ල කරන්නට උත්සාහ කරන්නවුත් හැඳින්වීම උදෙසා "ද්‍රෝහියා" යන වචනයට වඩා සුදුසු වෙනස් වචනයක් සොයා ගන්නට අමාත්‍යාංශයට නොහැකිය" වශයෙන් අමාත්‍යාංශයේ ආකල්ප විස්තර කිරීමට කතුවැකියෙහි යොදා ඇති වාක්‍යයෙහි වූ ස්වරය, අන්තර්ගතය සහ භාෂාව වෙනත් කිසිදු අවධාරණය කිරීමක් නොමැතිව වුවත් ලොමු දැහැගන්වන්නකි.

මෙම සංදර්භය යටතේ මාධ්‍ය විසින් හමුදාමය කරුණු සම්බන්ධව කෙරෙන වාර්තාකරණයන් හිදී ස්වේච්ඡාවෙන් අනුගමනය කළ යුතු බව හැඟවෙන අමාත්‍යාංශ මාර්ගෝපදේශ මාලාවක් වෙත එම කතුවැකිය කියවන්නන්ගේ අවධානය යොමු කරවයි.

එහි සඳහන් වාරණමය මාර්ගෝපදේශවලට අනුකූලව මාධ්‍ය විසින් නොකළ යුතු දේ ලෙස අවධාරණය කර ඇති කරුණු මෙසේය.

1. හමුදාමය උපායමාර්ග සම්බන්ධව විවේචනාත්මක වීම සහ ඒවා විශ්ලේෂණය කිරීම.
2. හමුදාව තුළ උසස්වීම් සහ ස්ථාන මාරු පිළිබඳව විමසුම් සහගත වීම.
3. හමුදාමය මිලදී ගැනීම් සහ ටෙන්ඩර් පිළිබඳව ප්‍රශ්න කිරීම.



සනත් බාලසූරිය - 077 3630000 උවිදු කුරුකුලසූරිය -0777289289 ධර්මසිරි ලංකාපේලි - 077364111එන්.එම් අමීන් - 077362999 ආර්. භාරතී- 0773628888
No. 237/22, Wijeya Kumaratunga Road, Colombo - 05, Email : ffm@sltnet.lk,

4. යුද විරෝධී ස්ථාවරයන් ප්‍රකාශ කිරීම හෝ සාකච්ඡාවට ගැනීම.
5. නිල හමුදා මාධ්‍ය ප්‍රකාශකයාගෙන් හැරුණු විට වෙනත් හමුදා නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීම.

ආරක්ෂක අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති මෙම නිර්දේශයන් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් වලට සහ හමුදාමය කරුණු වාර්තා කිරීම සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහමුලින් පටහැනිය. මෙම මාර්ගෝපදේශ වෙනත් ඕනෑම සංදර්භයකදී විහිලුවක් ලෙස සැළකියයුතු නමුත් නමුත් අද දවසේ ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් තම කටයුතු කරගෙන යන බියකරු, තර්ජනවලින් යුත් සහ අත්තනෝමතික හිංසාකාරී වාතාවරණය තුළ දී අවාසනාවන්ත ලෙස ප්‍රතිචාර දැක්වීමකට ලක් වන්නේ නැති තරම් ය.

මෙම මගපෙන්වීම් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය සහ මූලික මානව හිමිකම් ප්‍රතික්ෂෙප කරන ආකල්පයකිනි. එය විවෘත ආණ්ඩුකරණයටත් නිදහස් සංවාදයටත් අවදානමකි. වෙනස් වූ අදහස් පිළිගැනීම පිටු දකින්නකි. විනිවිදභාවයට, වගකිවයුතුභාවයට සහ යහපාලනයට නිදහස් මාධ්‍යයක් අත්‍යවශ්‍ය ය. එසේම අප සංවිධාන පැහැදිලි ලෙස දකින්නේ මෙම මාර්ගෝපදේශ ජාතික ආරක්ෂාව රැක ගැනීමේ ව්‍යාජ වුවමනාවෙන් ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය සීමා කිරීමට දරූ වෑයමක් ලෙසය.

හමුදාමය උපායමාර්ග සම්බන්ධයෙන් විවේචනාත්මක වූත්, හමුදාමය ගනුදෙනු සම්බන්ධයෙන් විමර්ශණශීලී වූත්, ස්ථානමාරු සහ උසස්වීම් පිළිබඳව ප්‍රශ්න කරන්නාවූත් එසේම ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටුමට යුද්ධයට විකල්පව ඇති වෙනත් විසඳුම් පිළිබඳ මත සාකච්ඡා කරන්නා වූත් මාධ්‍ය ආයතනවල සහ මාධ්‍යවේදීන්ගේ අයිතිය වෙනුවෙන් අප සංවිධාන අවිවාදයෙන් පෙනී සිටිති. එවැනි සාකච්ඡාවන් ජාතික ආරක්ෂාවට තර්ජනයකැ යි දරන මතය අපි සපුරා ප්‍රතික්ෂෙප කරමු. අප විශ්වාස කරන්නේ මෙම කරුණු පිළිබඳව විවෘතව සහ කරුණු සහිතව කෙරෙන සාකච්ඡාවක් ප්‍රජාතන්ත්‍රවාදය තුළ වූ පාලකයන්ට සහ පාලිතයන්ට යන දෙපාර්ශවයටම යුද්ධය පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ඇතිකර ගැනීමට බෙහෙවින් හේතු සාධක වන බවය.

එවැනි සාකච්ඡාවක් සඳහා වූ ක්‍රියාමාර්ගයක් ගැනීමත් එහි පුළුල් ප්‍රතිඵලත් අපගේ දේශයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් සාමය ගොඩනැගීමත් ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන බව අප සංවිධාන වැඩිදුරටත් කල්පනා කරති.

එමනිසා අප සංවිධාන එකමුතුව රජයෙන් ඉතා අවධාරණයෙන් ඉල්ලා සිටින්නේ මාධ්‍ය මත පනවා ඇති යට කී සීමාවන් ඉවත් කරගන්නා ලෙසයි. එසේම මෙම කතුවැකියෙහි අඩංගු කරුණු රජයේ නිල ප්‍රතිපත්තියද එසේ නැතහොත් හුදෙක් එය ලියූ සංස්කාරක වරයාගේ අදහස් දැයි යන්න ගැන පැහැදිලි කිරීමක් කරන ලෙසත්, ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මෙම ලිපිය පළවීම නිසා එහි අභිප්‍රාය පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ අදහස් ප්‍රකාශ කරන ලෙසත් වැඩිදුරටත් ඉල්ලා සිටීමට අපට සිදුවී තිබේ.



සනත් බාලසූරිය - 077 3630000 උවිඳු කුරුකුලසූරිය -0777289289 ධර්මසිරි ලංකාපේලි - 077364111එන්.එම් අමීන් - 077362999 ආර්. භාරතී- 0773628888
No. 237/22, Wijeya Kumaratunga Road, Colombo - 05, Email : ffm@sltnet.lk,